*සැ. යු.*- 2018.04.12 දින පළ වූ අංක 2,067 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,068 - 2018 අප්‍රේල් මස 20 වැනි සිකුරාදා - 2018.04.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 744 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 747 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 මැයි මස 11 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## රජයේ ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසරපත්‍ර ලැබීමට ගොවිජන පංතියට අයත් තැනැත්තන් තෝරාගැනීම සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත්‍ර සලකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට ආණමඩුව ප්‍රාදේශීය ලේකම් විසින් **2018.06.30 දින පෙ.ව. 10.00 ට ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී** රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(අ) ඉඩමේ විස්තරය :- 658 සී දිවුල්වැව ග්‍රාම නිලධාරි වසමට අයත් රණවිරු නිවාස ඉදිකිරීම සඳහා යෝජිත ඉඩම
(ආ) ඉඩම පිහිටි ගම :- දිවුල්වැව
(ඇ) ග්‍රාම නිලධාරි වසම :- 658 සී දිවුල්වැව
(ඈ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ආණමඩුව
(ඉ) දිස්ත්‍රික්කය :- පුත්තලම
(ඊ) අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය (වාරිමාර්ග පහසුකම් සලසන ලද හා/හෝ වාරිමාර්ග පහසුකම් සලසා නොමැති), වාරිමාර්ග පහසුකම් සලසා නොමැති ගොඩ ඉඩම්.
(උ) අන්සතු කරනු ලබන ඒකකය, 01. නේවාසික කටයුතු සඳහා පර්. 15 සිට පර්. 20 දක්වා.

02. දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින රණවිරුවන් සහ එම පවුල්වල සාමාජිකයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත් සලකා බලනු ලැබේ.

03. සියලුම ඉල්ලුම්පත්‍ර 2018.06.21 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම් ආණමඩුව වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතු ය.

04. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2018.06.30 දින පෙ.ව. 10.00 ට ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

05. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරනු තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නියම කරන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

06. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ දී අවසරපත්‍රයක් ලැබෙන අතර, එය එහි සඳහන් කොන්දේසිවලට යටත්වනු ඇත.

07. (අ) ක්‍රියාන්විත සේවයේ යෙදී සිටිය දී මියගිය හෝ අතුරුදහන් වූ රණවිරුවන්ගේ පවුලේ ළඟම ඥාතියෙකුට සහ ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී පූර්ණ ආබාධිත තත්වයට පත්වූ රණවිරුවන්ට පදිංචිය සඳහා සාමාන්‍යයෙන් ඉඩම් බෙදා දීමේ දී සැලකිල්ලට ගනු ලබන ඉඩම් ඒකකයේ ප්‍රමාණය පදනම් කර ගෙන ඉඩම් කොටසක් මුලින් රජයේ ඉඩම් ආඥාපනත යටතේ වාර්ෂික බලපත්‍රයක් මත නොමිලේ ලබා දීම.

(ආ) අනෙකුත් රණවිරුවන් අතරින් අවසරපත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරාගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබ ඇත්තේ කවර ඉඩමක් සඳහා ද, ඒ ඉඩම් වෙනුවෙන් පර්චස් එකකට රුපියල් 150.00 ක් බැගින් ගණන් බලනු මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතුව ආපසු නොගෙවනු ලබන නමුත්, තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැණුම් මිලට එය හිලව් කරනු ලැබේ.

ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර හා අදාළ ඉල්ලුම්පත්‍රය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් හා ඔවුන්ගේ ඉදිරියෙන් දක්වන ස්ථානවලින් ද ලබාගත හැක.

* ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ආණමඩුව.
* ජනපද නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ආණමඩුව.
* ග්‍රාම නිලධාරි, 658 සී දිවුල්වැව.

ඩී. එම්. කේ. සී. දිසානායක,
ඉඩම් කොමසාරිස්,
වයඹ පළාත.

2018 මාර්තු මස 29 වැනි දින දී ය.

**ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රජයේ ඉඩම් ආඥා පනත යටතේ පදිංචි වීම/ ව්‍යාපාරික/ කෘෂිකාර්මික කටයුතු සඳහා ඉඩම් ඉල්ලීමේ ඉල්ලුම්පත්‍රය**

01. සම්පූර්ණ නම :..........................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................

03. 1. ලිපිනය :..........................................................................................

2. ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :..........................................................................................

*(අ)* ග්‍රාම නිලධාරි කොට්ඨාසය :..........................................................................................

04. ගෘහ මූලික අංකය :..........................................................................................

05. ස්ත්‍රී/පුරුෂ භාවය :..........................................................................................

06. වයස (අයදුම්පත් භාරගන්නා අවසන් දිනය) :..........................................................................................

07. උපන් දිනය :..........................................................................................

08. විවාහක/අවිවාහක බව :..........................................................................................

09. රැකියාව :..........................................................................................

10. අයදුම්කරු, කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :

| *නම* | *අයදුම්කරුට ඇති සම්බන්ධය* | *රැකියාව* | *වාර්ෂික ආදායම* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර :

| | | | |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(නිවාස සහ දේපළ උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු යි.)

12. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය :..........................................................................................

13. දැනට තමා පදිංචි නිවසේ තත්ත්වය :..........................................................................................
(තමාගේ ද?/කුලියට ද?/අනවසරයෙන් ද? යන වග)

14. නිවස පිහිටි ස්ථානය :......................................................................................................

15. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :..................................................................................

16. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| *නම* | *වයස* | *ඉගෙනුම ලබන පාසැලේ නම* | *ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

17. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිල දී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත් ද? එසේ නම් පහත විස්තර සපයන්න :

(i) ලබාගත් ණය මුදල :......................................................................................................................
(ii) ණය ලබාගත් ආයතනයේ/දෙපාර්තමේන්තුවේ නම :.......................................................................
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :.......................................................................................................

18. පවුලේ යම් සාමාජිකයෙකු මුදල් ඉතිරි කර තිබේ ද? තිබේ නම් පහත විස්තර සපයන්න :

| *පවුලේ සාමාජිකයාගේ නම* | *ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය* | *ඉතිරි කළ මුදල* |
|---|---|---|
| | | |
| | | |
| | | |

19. ඉඩම් ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟ වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06ක කාල සීමාවක් තුළ ඉඩම ප්‍රමාණවත් පරිදි සංවර්ධනය කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුවද අසත්‍ය බව හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

.........................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉහත අයදුම්කරු විසින් ඡේද 01 සිට 19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බව ද, එම තොරතුරු දන්නා තරමින් නිවැරදි බව ද මෙයින් සහතික කරමි.

............................................,
ග්‍රාම නිලධාරීගේ අත්සන.

නම :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.
අනු අත්සන් කරමි.

නම :————.
ලිපිනය :————.

..............................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

**දිවුරුම් ප්‍රකාශය**

.......................................... දිස්ත්‍රික්කයේ ............................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ............................ ග්‍රාම නිලධාරි වසමේ .......................................................................... පදිංචි ........................................................ වන මම, පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද, මාගේ කලත්‍රයාට ද සහ වයස අවුරුදු 18 ට අඩු මාගේ දරුවන්ට ද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1793 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(2) එසේම, ඉහත කී අක්කර ................ රූඩ් ............. පර්. ............ ක් වූ ඉඩම් පවරා ගැනීමෙන්, මිලදී ගැනීමෙන් පසුව වුවද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනතේ (50) සීමාව නොඉක්මවන බවත්, වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

.........................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරියට මෙහි අඩංගු දෑ කියවා, තේරුම්කර දුන් අතර, ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

...................................................,
සමාදාන විනිශ්චයකාර තැන.

04-668

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ ගෙවල් කුලී මණ්ඩල ලේකම් තනතුරෙහි III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත/ සීමිත තරග විභාගය - 2018**

1.0 අංක 231 හා 2011.06.28 දිනැතිව දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් අනුමත කරන ලද හා 2014.01.13 දිනැතිව සංශෝධිත දකුණු පළාත් රාජ්‍ය සේවයේ ගෙවල් කුලී මණ්ඩල ලේකම් තනතුර සඳහා වන සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අනුව දකුණු පළාත් රාජ්‍ය සේවයේ ගෙවල් කුලී මණ්ඩල ලේකම් තනතුරෙහි III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත/ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් දකුණු පළාතේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව 02 කි. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2018.05.17 දින වන අතර මෙම විභාගය 2018 ජුනි මස ගාල්ල නගරයේ දී පවත්වනු ලබයි.

2.0 දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම සිදුකෙරේ. පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50% ක් විවෘත තරග විභාගයෙන් හා 50% ක් සීමිත තරග විභාගයෙන් බඳවා ගන්නා අතර බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ බලය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

3.0 පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 වැටුප : අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, දකුණු පළාත් රාජ්‍ය සේවයේ ගෙවල් කුලී මණ්ඩල ලේකම් තනතුරට අදළ වැටුප් කාණ්ඩය MN 4 - 2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 31,490 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - 54,250 වේ. එම චක්‍රලේඛනයේ උපලේඛන II අනුව 2018.01.01 දින සිට 2018.12.31 දින දක්වා අදළ වනුයේ රු. 24,980 ක මූලික වැටුපක් හා රු. 3,278 ක ගැලපුම් දීමනාවකි.

5.0 මෙම තනතුර ස්ථිර තනතුරකි.

6.0 **සුදුසුකම්** :- දකුණු පළාත් රාජ්‍ය සේවයේ ගෙවල් කුලී මණ්ඩල ලේකම් තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම සම්පූර්ණ කළ යුතු වේ :

I. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
II. මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත අය විය යුතු ය.
III. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ වසර 05 ක කාලය තුළ දකුණු පළාත් සභා බල ප්‍රදේශයේ අනුගාමී වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය. පදිංචිය සනාථ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ය.

*(අ)* මැතිවරණ කොමසාරිස් විසින් නිකුත්කරන ලද ඡන්දහිමි නාමලේඛන උද්ධෘතය.
*(ආ)* ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරි විසින් නිකුත්කරන පදිංචි සහතිකය.

IV. මෙම අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට ප්‍රථම පහත සඳහන් අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් සපුරා තිබිය යුතු ය.

**විවෘත අයදුම්කරුවන්,**

*අධ්‍යාපන සුදුසුකම්.-*

- සියලුම අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/ දෙමළ හා ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව, විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතු ය.

*හා*

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

සීමිත අයදුම්කරුවන්,

*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.-*

- සියලුම අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/ දෙමළ හා ගණිතය විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව, විෂයයන් හයක් (06) සමත් වී තිබිය යුතුය.

*හා*

- අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර විෂයයන් 03 කින් සමත් වී තිබීම.

*හා*

- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පළාත් රාජ්‍ය සේවයේ කළමනාකරණ සහකාර සේවාවේ හෝ සමාන්තර තනතුරක හෝ ඊට ඉහළ සුදුසුකම් සහිත තනතුරක අඛණ්ඩව වසර 07 ක සක්‍රීය සේවා කාලයක් තිබිය යුතු අතර, සුදුසුකම් ලැබීම සඳහා වන සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබිය යුතු අතර, එම කාලය තුළ විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතු ය.

- දැනටමත් රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරක් දරන අය සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

7.0 **විභාග පරිපාටිය** :-

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්තවේ. සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර, ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

| විෂයය | | ලකුණු | කාලය |
|---|---|---|---|
| I. | අභියෝග්‍යතා පරීක්ෂණය | 100 යි | පැය 01 යි |
| II. | සාමාන්‍ය දැනීම | 100 යි | පැය 01 යි |

ඉහත විෂයයන්ට අදාළ විෂයය නිර්දේශ පහත පරිදි වේ.

7.1 අභියෝග්‍යතා පරීක්ෂණය :-

අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවය, විශ්ලේෂණ තත්ත්වයන්, තීරණ ගැනීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි.

7.2 සාමාන්‍ය දැනීම :-

ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සමාජමය, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද, ජාතිකව හා අන්තර්ජාතිකව වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් බැගින්වත් (40%) අපේක්ෂකයකු විසින් ලබාගත යුතුවන අතර, පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

ලිඛිත විභාගයේ ප්‍රතිඵල සියලුම අයදුම්කරුවන් වෙත නිකුත් කරනු ඇත.

8.0 විභාග ගාස්තු :- විභාග ගාස්තුව රු. 400/- කි. මෙම මුදල දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැරවන ලෙස දකුණු පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා අයදුම්කරුගේ නමින් වූ ලදුපත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර, විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, තැපැල් හෝ උපතැපැල් කාර්යාලවලට ගෙවන ලද මුදල් භාරගනු නොලැබේ.

9.0 අයදුම්පත්‍ර :- ඒ 4 (සෙ.මී. 21 x 29) (සාමාන්‍ය හාෆ්ෂීට්) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

*(අ)* අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද,

*(ආ)* අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත්වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් ම අයදුම්පත්‍රය පිරවිය යුතු ය.

*(ඇ)* අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක. අයදුම්පත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.sp.gov.lk මගින් ද ලබා ගත හැකි ය.

9.1 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ සෑම අතින් ම සම්පූර්ණ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට් නිවේදනය* අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

9.2 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "**දකුණු පළාත් රාජ්‍ය සේවයේ ගෙවල් කුලී මණ්ඩල ලේකම් තනතුරෙහි III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත/ සීමිත තරග විභාගය - 2018**" යන්න සඳහන් කරන්න.

9.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු, වාර්ෂික වැටුප රු. 240,360/- ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

9.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018 මැයි මස 17 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
6 වන මහල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සංකීර්ණය,
ගාල්ල.

10.0 විභාගයට පෙනී සිටීම - අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව හා විභාග දිනය දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. ඒ අනුව ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් ඒ බව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතු ය. "ඔබ වෙත තබා ගත් අයදුම්පතෙහි පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද කුවිතාන්සියේ පිටපත සහ ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය සඳහන් කරමින් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් විමසන ලෙස දන්වන අතර, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට ඔබගේ ෆැක්ස් අංකය ද සමග ඉහත ඔබගේ විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ෆැක්ස් මගින් යොමුකරමින් විමසා සිටීම ද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත."

අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැලකිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.

11.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

යූ. ජී. විදුර කාරියවසම්,
ලේකම්,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2018 මාර්තු මස 29 වැනි දින,
දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
6 වන මහල,
දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,
ගාල්ල.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා [ ]

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය [ ]

ආදර්ශ අයදුම්පත්‍රය

**දකුණු පළාත් රාජ්‍ය සේවයේ ගෙවල් කුලී මණ්ඩල ලේකම් තනතුරෙහි III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත/ සීමිත තරග විභාගය - 2018**

**Open/ Limited Competitive Examination for Recruitment of Rent Board Secretary to Southern Provincial Public Service – 2018**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම් කරන විභාගය :

විවෘත - A
සීමිත - B [ ]
(අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකුරු අගට යොද මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..................................................................
..................................................................
(උදා.: GUNAWARDHANA H.M.S.K. )

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..................................................................
..................................................................
(උදා.: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/ දෙමළෙන්) :- ..................................................................
..................................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :- [ | | | | | | | | | | | ]

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-..................................................................
..................................................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :- ..................................................................
..................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :- ..................................................................
..................................................................

3.0 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය :- වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

3.3 2018.05.17 දිනට වයස :- අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

3.4 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ..................................................................

3.5 දුරකතන අංකය :- | | | | | | | | | | |

3.6 විද්‍යුත් තැපැල් ලිපිනය (E- mail address) :- ..................................................................................................................................

4.0 අධ්‍යාපන සුදුසුකම් :-

4.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය පිළිබඳ විස්තර :

i. විභාගයේ වර්ෂය හා මාසය :- ..................................
ii. විභාග අංකය :- ......................................
iii. ප්‍රතිඵල :-

| වර්ෂය - ................................................ | | | වර්ෂය - ................................................ | | |
|---|---|---|---|---|---|
| | විෂයය | ශ්‍රේණිය | | විෂයය | ශ්‍රේණිය |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |
| 4. | | | 4. | | |
| 5. | | | 5. | | |
| 6. | | | 6. | | |
| 7. | | | 7. | | |
| 8. | | | 8. | | |
| 9. | | | 9. | | |
| 10. | | | 10. | | |

4.2 අ.පො.ස. (උසස් පෙළ) විභාගය පිළිබඳ විස්තර :-

i. විභාගයේ වර්ෂය හා මාසය :- ..................................
ii. විභාග අංකය :- ......................................
iii. ප්‍රතිඵල :-

| | විෂයය | ශ්‍රේණිය | | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 1. | | | 3. | | |
| 2. | | | 4. | | |

4.3 ලබා ඇති උපාධිය පිළිබඳ විස්තර :-

| උපාධිය/ ඩිප්ලෝමා/ වෘත්තිය සහතිකයේ නම | වලංගු වන දිනය | විෂයයන් | සාමාර්ථතාව | විශ්ව විද්‍යාලය/ නිකුත් කළ ආයතනයේ නම |
|---|---|---|---|---|
| | | | | |

5.0 ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් : ☐ නැත : ☐

6.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :-

i. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :- .....................................
ii. ලදුපත් අංකය හා දිනය :- .....................................
iii. ගෙවූ මුදල :- .....................................

| |
|---|
| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදුපතේ ඡායාස්ථ පිටපතක් ළඟ තබාගන්න.) |

7.0 දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවෙකු නම්,

7.1 දෙපාර්තමේන්තුව / ආයතනය :- .....................................
7.2 දැනට දරන තනතුර :- .....................................
7.3 පත්වීම් දිනය :- .....................................
7.4 සේවා කාලය :- අවු. .............................
7.5 ස්ථිර විශ්‍රාම වැටුප් හිමි හෝ තාවකාලික ද යන වග :- .....................................
(සේවය ස්ථිර කිරීමේ ලිපියේ පිටපතක් අමුණන්න)

8.0 **අයදුම්කරුගේ ප්‍රකාශය :**

මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සියල්ල මාගේ දැනීමේ හා විශ්වාසය අනුව නිවැරදි සහ සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවූ ............................................ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක ............................. හා ............................. දින දරන ලදුපත මෙහි අලවා ඇති බවත්, මෙම තනතුරට මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසු හෝ පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම පිළිගනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

දිනය :- ........................................

.............................................,
අයදුම්කරුගේ අත්සන.

9.0 **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ....................................... මිය/ මෙනෙවිය/ මහතා මම පෞද්ගලිකව හඳුනන බවත්, .............................. වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

දිනය :- ...........................................

.......................................................,
(සහතික කරන්නාගේ අත්සන.)

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :-.........................................................................................
තනතුර :-.........................................................................................
ලිපිනය :- (නිල මුද්‍රාව තබන්න)

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය)

10.0 **ආයතන ප්‍රධානියාගේ සහතිකය/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ...................................... මයා/ මිය/ මෙනවිය .............................................. කාර්යාලයේ/ ආයතනයේ ....................... දින සිට ...................................... තනතුරක සේවය කරන බවද, ඔහුගේ/ ඇයගේ සේවය සතුටුදයක වන බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි බවද/ කළ

නොහැකි බවද ඇය/ ඔහු මෙතෙක් මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

දිනය :- ............................................

..........................................................................................................
ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

ආයතන ප්‍රධානියා/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නම :-...........................................................................................
තනතුර :-..........................................................................................
ලිපිනය :-..........................................................................................
(නිල මුද්‍රාව තබන්න)

04-667

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.